**CORGI Registered Central Heating Engineer**
**Reliable, friendly. Any work not too small.**
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
**නාමල් Namal - 0 7 9 5 8 7 2 0 9 1 2**


ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි, අදහස් හා දැන්වීම් ඒවා ලියා එවන අයගේය. එබැවින් ඒවා ගැන කර්තෘගේ කිසිදු වගකීමක් නැති බව කරුණාවෙන් සලකන්න.

**මෙම ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් මාස්පතා ඔබේ ගෙදරට ගෙන්වා ගන්නට පවුම් 10 ක චෙක්පතක් කරුණාකර පහත සඳහන් ලිපිනයට එවන්න**

**Lanka Viththi, P.O.Box 14373, London NW6 3WU**


## ලිහිණියා LIHINIYA
**ලන්ඩනයේ ජනප්‍රිය ශ්‍රීලංකා අවන්හල**
වසර 10 ක අඛණ්ඩ සේවය
**ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ**
**Buffet Daily £5.00 Weekend £6.50**
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප, පිට්ටු, රොටි කොත්තු, බුරියානි, ලම්ප්‍රයිස් හා පරාටා
***උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.***
Tel. 0208 450 9052 / 0208 208 2658
**66 Cricklewood Broadway, London NW2 3EP**

## ZOOM VISION VIDEO
Broadcast quality wedding video
- Use of broadcast quality 3 chip digital camera by a qualified videographer.
- Editing with Avid Digital Non-linear system.
- Montage or music video of your choice.
- DVD and VHS copies of the edited master.
- Coverage of Eastern & Western weddings.
- We also cover birthday parties, social functions, other special occasions.



T- 020 8590 6034 Mob. 07859000421

**වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි**
## සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 4 4 8 2 7 0 / 4 3 2 2 3 6
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
**සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ. දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.**
## TRICO
## Shipping & Forwarding Ltd
**555 White Hart Lane**
**London N17 7RP**
Telephone 0 2 0 8 888 8 7 8 7
Fax 0 2 0 8 889 5 4 4 5
E-Mail : trico@tricoshipping.com
***නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය***




## නියම නැන්දම්මා

**මැ**දි වියේ කාන්තාවන් දෙදෙනෙක් එකිනෙකාට බැනවදිමින් හොඳ සූට් එකකින් සැරසුණු තරුණයෙකු ද බෙල්ලෙන් ඇදගෙන නුවණක්කාර සොලමන් රජු ඉදිරියට ආහ.

" රජතුමනි මෙයා ලෝයර් කෙනෙක්. මෙයා මගේ දුව බඳින්න පොරොන්දු වුණා."

එක් ගැහැණියක් කීවාය.

" නෑ රජතුමනි..... මෙයා මගේ දුව ව බඳින්නයි පොරොන්දු වුණේ. " දෙවෙනි ගැහැණිය කීවා ය.

එසේ කියා උන් දෙදෙනා රජු ඉදිරියේ කෑ ගසමින් තරුණයාගේ අත්වලින් අල්ලා දෙපැත්තට අදින්නට වූහ.

" නවත්තපියව් තොපේ සද්දෙ" රජතුමා සැරවීය. එතුමා රාජපුරුෂයෙකු අමතා මෙසේ කීය.

" අරන් වරෙන් මෙහාට ලොකු කියතක්."

රාජ පුරුෂයා කියතක් ගෙනාවේ ය.

" හරි දැන් මම මේ ප්‍රශ්නෙ විසඳන්නයි යන්නෙ. මම දැන් මූව දෙකට කපලා උඹල දෙන්නට දෙන්නම්. කෑලි දෙක බෙදාගනිල්ලා. නැතුව වෙන විදියකට මේක විසඳන්න බෑ."

" අන්න හරි රජතුමනි, දෙකට කපන්න..." 1 වෙනි කාන්තාව කීවාය. එවිට 2 වෙනි කාන්තාව ඉදිරියට විත් මෙසේ කීවා ය.

" රජතුමනි..... ලේ හලන්න එපා..... කමක් නෑ, මේ තරුණයා මෙයාගෙ දුව බැඳපුවාවෙ...."

එසේ කියා රජතුමාට වැඳ ඇය පිටවී ගියා ය. රජතුමා 1 වෙනි ගැහැණියට මෙසේ කීවේ ය.

" දැන් මේ හාදයා අයිති උඹටයි. එක්ක ගිහින් මෙයාට දුව බන්දලා දීපන්......"

මෙතැන සිටි රජුගේ පුරෝහිතයා මෙසේ කීය.

" රජතුමනි ඒ තීන්දුව හරිද? මේ ගෑණි බෑනා දෙකට කපනවටත් කැමතිවුණා නේ......"

" ඔව් ඉතිං ඒකෙන්ම පේනවනේ මේ නියම නැන්දම්මයි කියලා." රජු කීය.

## වැරදි ටෙලිපෝන් එක

**ක**න් දෙකම හොඳටම රතු වූ කාන්තාවක් තම දොස්තර හමුවන්නට ගියාය. කන් දෙක රතු වුණේ ඇයි දැයි දොස්තර මහතා ඇසුවේය.

" මම මගේ සායක් මැද මැද ඉන්න කොට ටෙලිපෝන් එක රිං වුණා ඩොක්ටර්.... ඉතින් මම පෝන් එක ගන්නවා වෙනුවට වැරදීමෙන් ඉස්තිරික්කෙ කණේ තියලා හලෝ කිව්වා....."

" මගෙ අම්මෝ....." දොස්තර පුදුමයෙන් පැවසීය. " එතකොට අනික් කන රතු වුණේ කොහොමද....? "

" ඒ යකා ආයිත් පෝන් කළානේ....."

## අපහසු තීරණයක්

**කා**න්තාවක් මහ රෑ තම සැමියා අවදිකරවා මෙසේ කීවා ය.

" මේ දන්නව ද වැඩක් ? අන්න හොරෙක් කුස්සියට ඇතුල්වෙලා අර මම හවස හදපු පුඩිං එක කනවා..."

" හරි වැඩේ..." සැමියා කීය. " දැන් මම කාටද කතාකරන්නේ? පොලීසියටද....? ඇම්බියුලන්ස් එකටද...? "

## නපුරු දහතුන

**අං**ගොඩ මානසික රෝහල අසලින් ගිය කෙනෙකුට එහි ඇතුලතින් කිසිවෙකු දහතුනයි... දහතුනයි... දහතුනයි... යනුවෙන් නොකඩවා ශබ්ද නගා කියනවා ඇසිණ.

ඒ කුමක්දැයි දැනගන්නට දැඩි කුතුහලයක් ඔහුට ඇතිවිය. උසට බැඳ ඇති තාප්පය වටේටම යනවිට වාසනාවට තාප්පයේ එක තැනක් ඉරිතලා සිදුරක් සෑදී තිබිණ. ඔහු ඒ සිදුරට ඇස තබා බැලීය. එකෙනෙහිම කිසිවෙකු ඔහුගේ ඇසට ඇන්නේය. වේදනාවෙන් ඔහු වහා තාප්පයෙන් ඉවතට යත්ම ඇතුළත හඬ එවිට දහහතරයි.. දහහතරයි... යනුවෙන් කෑගසනවා ඇසිණ.

## ප්‍රථම පියවර

***අ**ළුත් සාත්තු සේවිකාව ප්‍රථමාධාර පන්තියේ දේශනයට සහභාගි විය.*

**දේශක :** හිතන්න හදිසි අනතුරක් සිදුවෙලා අධිකව ලේ ගලන තුවාලකරුවෙක් ඔබ ඉදිරියට ගෙනෙනවා කියලා. ඉස්සෙල්ලම ඔබ මොකද කරන්නෙ.?

**නර්ස් :** සිහිය නැතුව වැටෙනවා.


Community Legal Service
# ANTONS
## SOLICITORS
**Community Legal Service**
**For Quality Services**
We offer a comprehensive range of Legal Services.

| Conveyancing | Immigration |
| --- | --- |
| ♦ Sale & Purchase | ♦ Asylum cases |
| ♦ Right to buy (Council House) | ♦ Asylum Application |
| ♦ Re-Mortgage | ♦ Judicial Reviews |
| ♦ Assignment of Lease | ♦ Extensions of Visas |
| ♦ New Lease | ♦ Marriage Applications |
| ♦ Licensing Applications | ♦ Work Permits |
| ♦ Contractual Disputes | ♦ Business Visas |

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

***Contact -*** **Mrs Rani Bulathwela 0 7 8 0 8 1 5 8 3 6 0**
**Rohitha – 0 7 9 5 6 5 4 9 4 4 7 Nihal – 0 7 9 3 0 3 1 0 9 6 7**
**Vajira – 0 7 8 8 7 8 4 0 2 2 7**

## ANTONS SOLICITORS
**14 Wordsworth House, Wordsworth Parade**
**London N8 0SJ**
Tel. 0208 888 6211 Fax 0208 888 1403
***E-mail :*** **antons.solicitors@btopenworld.com**




# Wife Carrying Competition
# බිරිඳ ඔසවාගෙන යෑමේ තරඟය

**Where it's held:** Several places around the world, but most famously in Sonkajävi, Finland

**What happens:** Husbands haul their better halves around a 253-metre obstacle course as fast as possible. Competitors are allowed to carry a female that isn't actually their wife - so men whose ladies have piled on the pounds can instead borrow a neighbour's slimmer spouse and increase their chances of victory. There are additional prizes for the most entertaining couple and the twosome in the best outfit.

**Why it happens:** In years gone by, the Finnish dating scene was far simpler; men would maraud into a village, grab a woman they liked the look of, and carry her off at speed. The event is a humorous allusion to this practice - and an excuse for lots of fun. - **Keerthi**

**බි**රිඳ ඔසවාගෙන යෑමේ ශූරතා තරඟය අද ලෝකයේ බොහෝ රටවල පැවැත්වේ. සාමාන්‍ය ධාවන තරඟයක් හෝ බාධක දිවීමක් හෝ මැරතන් තරඟයක් තරමට ලෝක ප්‍රසිද්ධ නොවූවත් මෙම **බිරිඳ ඔසවාගෙන යෑමේ තරඟය** අද ලොව බොහෝ රටවල ජනප්‍රියත්වයට පත්ව තිබේ. එහෙත් මෙහි මුල් පටන්ගැන්ම පින්ලන්තයේය. නියම කරන ලද ධාවන පථයක් ඔස්සේ තම බිරිඳ බිම නොතබාම ඔසවාගෙන දිනුම් කණුව වෙත දුව යෑම සහභාගිවන පිරිමියාගේ කාර්‍යයයි.

ධාවන දුර මීටර් 253 කි. එය බාධක සහිතය. කරතබාගෙන යන තැනැත්තිය තම බිරිඳ විය යුතු ම නැත. මේ ඉඩදීම නිසා මහත දෙහෙත බිරියන් සිටින සමහර පිරිමි අල්ලපු ගෙදර කාන්තාව ඉල්ලා ගෙන ඔසවන් යති. ඉතා විනෝදජනක ලෙස තරඟයෙන් දිනන හා නරඹන්නන්ගේ සිත් අදින ඇඳුමෙන් සැරසුණු යුවලට අතිරේක තෑගි ද හිමිවන්නේ ය.

මෙම තරඟය ඇතිවුණේ අතීතයට සම්බන්ධ ක්‍රියාවලියක් ආශ්‍රයෙනි. පුරාණයේ පින්ලන්තයේ පිරිමින් විවාහවූයේ ගමකට ගොස් තම හිත ගිය තරුණියක් වේ නම් ඇය බලහත්කාරයෙන් ඔසවා කර තබාගෙන තම ගමට දුවගෙන යෑමෙනි. ඒ පුරුද්ද අද **බිරිඳ ඔසවාගෙන යෑමේ ක්‍රීඩාවක්** බවට පරිවර්තනය වී ඇත. - **කීර්ති**

## නවත්තපු කාරණේ

**න**ගරයේ වාහන හසුරුවමින් සිටි පොලිස් කොස්තාපල් පාර මැද වූ එක්වාහනයක් ළඟට දුවගොස් එහි රියැදුරාට මෙසේ සැර කළේය.

" ඇහුණෙ නැද්ද ඕයි නවත්තන්න කියලා මම තමුසෙට කෑගහනවා........"

*එවිට වාහනයේ රියැදුරු මෙසේ කීය.*

" මට ඇහුණේ රාළහාමි ගුඩ් මෝනිං ඉන්ස්පෙක්ටර් මහත්තෙයා කියලා කියනවා වගේ........"

" ආ ඒක හරි සර්.... මං මේ දුවගෙන ආවෙ තව ඉස්සරහට යනකොට මාර වාහන තදබදයක් තියෙනවා කියලා සර්ට කියන්නයි...."